සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

# සිංහල සාහිත්‍ය රසාස්වාදය

කාලය පැය 03 යි

නම/ විභාග අංකයඃ

- මෙම ප්‍රශ්න පත්‍රය (I) පත්‍රය හා (II) පත්‍රය යන කොටස් දෙකකින් සමන්විතය.

## I - පත්‍රය

- (I) පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න. (I) හා (II) පත්‍රය වෙන වෙනම භාර දෙන්න.

(01) (i) සිට (v) දක්වා ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''තොපි කුමක් නිසා අවුද, තොපි කුමක් නිසා අවු දැ''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.............................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කුමන අවස්ථාවකදී ද?

.............................................................................................................

(ii) '' කැවිට හූලම සොළසගුලක් පමණ වූ කැවිටක් කරවාලා කැවුටුවම් කොටත් ගෙන යමි. ''

(අ) මෙහි අර්ථය ලියන්න.

.............................................................................................................

(ආ) ඉහත උද්ධෘතය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

.............................................................................................................

(iii) '' එයා අපට ජීවත් වෙන්ට ඉඩ හැරලා ගියා.''

(අ) මෙහි 'එයා' යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද ?

.............................................................................................................

(ආ) ඉහත ප්‍රකාශය උපුටා ගත් කෙටි කතාව සිංහලයට නගන ලද්දේ කවුරුන් විසින් ද?

.............................................................................................................

(iv) රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වන'තුරු
මිතුරු වේය දිගතින් හමන මඳ මරු
මිතුරු නැසීමට එම වෙයි පසමිතුරු
මිතුරු නැ කෙනෙක් නිවතුන් හට කවුරු

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

.............................................................................................................

(ආ) මෙම කවිය ඇතුළත් කෘතියේ කතුවරයා කවුරුන් ද?

.............................................................................................................

(v) පොල් දෙහි දොඩම් ගස් තුන හතරෙකි වත්තේ
දුප්පත්කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙස ද කියා කළගුණ සැළකිය යුත්තේ
දුන් සත පනහවත් ඔහු නැත පිළි ගත්තේ

(අ) මෙම කවිය ඇතුළත් පැදි පෙළ කුමක් ද?

..............................................................................................................................................

(ආ) ''දුන් සත පනහවත් ඔහු නැත පිළි ගත්තේ''
යන්නෙන් මතු කරන අදහස කුමක් ද?

..............................................................................................................................................

(ලකුණු 4 × 5 = 20)

(02) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

හේ කොස්ද යත්,

බුදුහු බුදුවලා බිම්සර මහ රජුගේ අයදමෙන් රජගහනුවර වැඩ වේලුවන වසන සේක්. පිය රජ්ජුරුවන් ගේ ආරාධානාවෙන් කිඹුල්වත් නුවරට වැඩ නිග්‍රෝධ නම් අරම සැතපිලා දෙවන දවස් සිගා ඇතුළු කිඹුල්වත් නුවරට වැඩි සේක්. නැතක් දවසින් දුටු පිය රජ්ජුරුවන්ට උපන්නක් දෙන්නාක් මෙන් ගාථා පමණකින් සෝවාන් කරවා මිනිස් ලොව උපදිතොත් සත් වරෙකින් වඩාත් නොහොත් දෙතුන් වරකින් වඩාත් නැත. එක වරෙකින් වඩා නූපදනා ලෙස කොටලා අනික් ගාථාවකින් මහා ප්‍රජාපතී ගෝතමී නම් කුඩා මෑණියන්දෑ ගෙන් පූ තන කිරෙහි කිරි මිල ගෙවාලන්නාක් මෙන් උන්දෑ සෝවාන් කරවා පිය රජ්ජුරුවන් තනතුරෙන් වඩාලන්නා සේ සෙදගැමි කරවා එම දවස් වළඳා අන්තයෙහි බිම්බා බිසවුන්ගේ ගුණයෙහි තරම මහෞෂධ පණ්ඩිත අවස්ථාවෙහිත් විමසා තුබූ හෙයින් වදාරනු නිසා චන්දකින්නර ජාතකය වදාරා ඊට දෙවන දවස් නන්ද කුමරුන්හට වොටුනු මගුලත්,ගෙවදනා මගුලත්, විවාහ මගුලත් තුන එක අවධියට පැමිණි කල්හි මේ මගුල් තුනට වඩා නිවන් මගුල උතුම් බැවින් ඒ උන්ට පමුණුවා ලමි. නුවරට සිගා වැඩ සිගා අන්තයෙහි නිවන් අත්පත් වන ලෙසින් පාත්‍රා ධාතුන් වහන්සේ අතට දීලා ආදියෙන් යන ගමනට ඉෂ්ට සුවක කොට දුන් පාත්‍රය හෙයින් පාත්‍රය අතට හැර නොගත් සේක.

(i) පහත යෙදුම්වල අදහස ලියන්න.

(අ) නැතක් දවසින් දුටු පියරජ්ජුරුවන්ට උපන්නත් දෙන්නාක් මෙන්

..............................................................................................................................................

..............................................................................................................................................

(ආ) පිය රජ්ජුරුවන් තනතුරෙන් වඩාලන්නා සේ

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 04)

(ii) බුදු රජාණන් වහන්සේ චන්දකින්දර ජාතකය දේශනා කිරීමට හේතුව වශයෙන් මෙහි සඳහන් කරන්නේ කුමක් ද?

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 04)

(iii) ඉදිරිපත් කරන අදහස වඩා පැහැදිලි කිරීම සඳහා කතුවරයා යොදාගත් භාෂාමය උපක්‍රම පැහැදිලි කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 06)

(iv) බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කොට සිදුකළ විශේෂ කාර්යයන් පැහැදිලි කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 06)

**නැතහොත්**

එක් යුගයක ජීවනයේ සරතස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට පසු

බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ මිස
එ සඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නැසේ මට

මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයාදී රකිමින්
එ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය ඔබ

බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබි එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස බලා සිනහ නගයි.

බාලේ අපි ගම්දොර කෙළි මඩුලු මැදින් ආ ගමනේ
මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහිසැඟවිණි දැයි නොදැනේ

එක යුගයක ජීවිතයේ සරතස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමටද ඔබගේ අවසර

(i) මෙම නිර්මාණයට පාදක වී ඇති අත්දැකීම පැහැදිලි කරන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 04)

(ii) කවියා යොදාගත් ආකෘතිය එහි සාර්ථකත්වයට කොතෙක් දුරට ඉවහල් වී ඇත් ද යන්න දක්වන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 04)

(iii) චිත්තරූප මැවෙන භාෂාවක් යොදා ගෙන තිබීම කිවිඳියගේ අදහස ගම්‍ය කිරීමට හේතුවී ඇති ආකාරය පැහැදිලි කරන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 06)

(iv) නිර්මාණයේ සාර්ථකත්වය සඳහා කාව්‍යෝක්ති යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

(ලකුණු 06)

## II - පත්‍රය

- **පළමුවන ප්‍රශ්නය ද 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න. පිළිතුරක වචන 200ක් වත් තිබිය යුතුය.

විහාර මහ මැණිවරුන්
ඉපදුණ පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණ පොළොවයි
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණ පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුටයි

මහ සෑ රන් කොත මුදුනේ
ගන රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවනේ
සිහිලැල් පවනයි
දළඳා හිමි රැඳි විමනේ
බුදු රැස් දහරයි
හැමදා හැම දුක් දුරලා
පුතු සිත සනසයි

සතර අතින් මුහුද නැගී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතුවී
යසස උදාවෙයි
පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන්
ලැබුව නිදානයි

(i) මෙම පද්‍ය පන්තියේ තේමාව

(ii) කවියාගේ ආකල්පය

(iii) කවියා යොදාගත් බස් වහර

(iv) කවියා යොදාගත් ආකෘතිය

(ලකුණු 30)

(02) කුස ජාතකය හාස්‍ය රසය ජනනය කරන කතා වස්තුවකි. උදාහරණ තුනක්වත් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(03) උසස් මානව ගුණ ධර්ම නිරූපණය කිරීමට කවියා උත්සාහ දරා ඇත. 'වැහි වලාකුළ' පද්‍ය පන්තිය ඇසුරෙන් විමසන්න.

(04) මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් සත්ත්ව සංහතියේ පැවැත්මට තර්ජනය වී ඇති ආකාරය මනාව පෙන්වා දීමට ඇත්ගාලේ දරුපෙම පද්‍ය පන්තිය ඉවහල් වී ඇති අයුරු නිදසුන් තුනක්වත් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 බැගින්)

## පිළිතුරු පත්‍රය - I කොටස

01) (i) (අ) සත් රජ්ජුරුවන් විසින්
(ආ) පභාවතිය ලබා ගැනීම සඳහා සත් රජ්ජුරුවන් සාගල නුවර වටලා ගත් අවස්ථාවේ දී
(ii) (අ) කෝටු රාශියම අගල් 16 පමණ කෙවිටක් කර කෙවිටෙන් ඇන රැගෙන යමි / අගල් 16 දිග උලක් සහිත කෝටුවක් (කෙවිටක්) ගෙන පහර දෙමින් ගෙන යමි.
(ආ) සද්ධර්මරත්නාවලිය
(iii) (අ) ඉයෝනාගේ පුතා / කුශ්මා ඉයෝනිච්
(ආ) අමරදාස වීරසිංහ මහතා
(iv) (අ) වනතුරු - වනාන්තරයේ
නිවතුන් - දුප්පතුන්
(ආ) අලගියවන්න මුකවැටිතුමා
(v) (අ) ආගන්තුක සත්කාරය
(ආ) ගුණධර්ම මුදලට යටකළ නොහැකි බව (ලකුණු 4 x 5 = 20)

(02) (i) (අ) බොහෝ දවසකින් දුටු පියරජතුමාට උපයාගත් දෙයක් දෙන්නාක් මෙන්
(ආ) පියරජතුමා තනතුරෙන් උසස් කරන්නාක් මෙන්
(ii) බිම්බා බිසවුන්ගේ ගුණයෙහි තරම මහෞෂධ පණ්ඩිත අවස්ථාවකින් විමසා තිබූ නිසා
(ලකුණු 04)
(iii) උපමා තුළින් අදහස වඩා පැහැදිලි කරන බව විස්තර කර තිබිය යුතුයි. (ලකුණු 06)
(iv) පියරජු සෝවාන් කරවීම / සකෘදාගාමී කරවීම.
ප්‍රජාපතී ගෝතමී කුඩා මව සෝවාන් කරවීම.
බිම්බා බිසවුන්ට චන්ද කින්නර ජාතකය දේශනා කිරීම.
නන්ද කුමරු විහාරයට කැඳවාගෙන යාම.
යන කරුණු ඇතුලත් විය යුතුය. (ලකුණු 06)

නැතහොත්,
(i) කුඩා කල සිට මිතරෙකුමින් සිටි අයෙකු දිසාපති තනතුර ලැබ දුර ප්‍රදේශයක රාජකාරියේ යෙදී සිටින අවස්ථාවක සෙසු මිතුරා තම සගයා බැලීමට ගිය අවස්ථාවක ඔහුව නොපිළිගැනීම / ඔහු නොතකා හැරීම / ඔහු දෙස නොබලා සිටීම.
(ii) දෙපද ආකෘතිය යොදා ගැනීම මගින් තම අරමුණ සාර්ථකව ඉටුකර ගැනීමට හැකිවීම. තම අදහස නිවැරදිව සහෘදයා වෙත සමීප කළ හැකි වීම.
(iii) චිත්ත රූප දක්වන අවස්ථා දක්වමින් පැහැදිලි කර තිබීම.
(iv) දෙපද ආකෘතිය
(iv) දෙපද ආකෘතිය
සරල භාෂාව / චිත්තරූප දැක්වීම / උපමා භාවිතය / අනුප්‍රාස භාවිතය / ව්‍යංග්‍යාර්ථ භාවිතය

II පත්‍රය සඳහා ප්‍රශ්නවලට අදාළව ලියා ඇති පිළිතුරුවල ප්‍රමාණාත්ම බව හා නිරවුල්තාවය පිළිබඳව සලකා සුදුසු ලකුණක් ලබාදෙන්න.